නායයෑම් ආපදා අවමකරණය තුළින් නායයෑම්වලට ගොදුරු වීමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

ආපදා අවදානම් ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

ආපදා අවදානම් ස්ථානීය අංක 128

පල්ලෙකඩ, දෙල්විට

කුරුණෑගල දිස්ත්‍රික්කය

2020 ඔක්තෝබර්

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දුරකථන: 011 2588946/011 2503826/ 011 2503431

පටුන

1. හැඳින්වීම 1

1.1 ව්‍යාපෘති සාරාංශය 1

1.2 අපේක්ෂිත පරිශීලකයින් 2

2. ව්‍යාපෘතියේ සහ ස්ථානයේ විස්තරය 2

2.1 ව්‍යාපෘතියේ නම 2

2.2 ස්ථානීය විස්තර 2

2.3 ප්‍රවේශ මාර්ගය 3

2.4 භූ විද්‍යාත්මක ස්වභාවය සහ ඉඩම් හිමිකාරිත්වය 4

2.5 ප්‍රදේශයේ දේශගුණික හා කාළගුණික තත්ත්වය 4

3. බැවුම් අස්ථාවර වීම්/ නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු 6

3.1 සිදුවීම් සංඛ්‍යාව 6

3.2 ආපදා අවදානම අවමකරණයට ගෙන ඇති ක්‍රියාමාර්ග 7

3.3 ඉවත් කිරීම 7

3.4 නැවත පදිංචි කිරීම 7

4. නායයෑම්/ බැවුම් අස්ථාවර වී ඇති ප්‍රදේශය හා අවට පරිසරය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් තත්ත්වය 8

4.1 අවට පරිසරයේ ඉඩම් භාවිතය 8

4.2 වර්තමාන අවදානම් මට්ටම 8

5. ව්‍යාපෘතිය යටතේ යෝජිත අවදානම් අවමකරණ පියවරයන් පිළිබඳ විස්තරය 8

6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන් 8

7. ව්‍යාපෘතියට අදාළ අවදානම් සහ සමාජයීය හා පාරිසරික බලපෑම් හඳුනා ගැනීම 9

7.1 ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම 10

7.2 අහිතකර බලපෑම 10

7.2.1 ජල මූලාශ්‍රයන්ට සිදුවිය හැකි බලපෑම 10

7.2.1.1 මතුපිට ජලයේ ගුණත්වයට සිදුකරන බලපෑම 10

7.2.1.2 විවෘත මලපහ කිරීම සහ ජලය ආශ්‍රයෙන් පැතිරිය හැකි රෝග තත්ත්වයන් 10

7.2.1.3 පහළ බැවුමේ ජල මූලාශ්‍ර භාවිත කරන්නන්ට සිදුවන බලපෑම 10

7.2.1.4 ජල රටාවන්ට සහ ගුණත්වයට සිදුවන බලපෑම 10

7.2.2 පාරිසරික බලපෑම 11

7.2.2.1 ශබ්දය හා කම්පන පාලනය 11

7.2.2.2 පිපුරුම් සහ අන්තරායකර ද්‍රව්‍ය 11

7.2.2.3 වායු දූෂණ බලපෑම 11

7.2.2.4 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම 11

7.2.3 පාරිසර විද්‍යාත්මක බලපෑම 11

7.2.3.1 ශාඛවලට සිදුවන බලපෑම 11

7.2.3.2 වනජීවී වාසස්ථානවලට සිදුවන බලපෑම 12

7.2.4 සමාජ ආර්ථික බලපෑම 12
7.2.4.1 පහළ බෑවුමේ පිහිටා ඇති නිවාසවලට සිදුවන බලපෑම 12
7.2.4.2 ජීවනෝපාය සහ ආදායම් ඉපයීමේ කටයුතු සඳහා සිදුවන බලපෑම 12
7.2.4.3 ඉදිකිරීම් අතරතුර පුද්ගලයින් වැඩබිමට ප්‍රවේශ වීම 12
7.2.4.4 වැඩබිම් ඒකක සහ අනෙකුත් අවශ්‍යතා 12
7.2.4.5වැඩබිම් සේවකයින් සහ ප්‍රජාව අතර සම්බන්ධතා හා ගැටුම් ඇතිවීම 13
7.2.4.6 ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව 13
7.2.4.7 රථවාහන සහ මගීන්ට සිදුවන අවහිරතා 13
8. පාරිසරික සමාජයීය බලපෑමේ වැදගත්කම 13
8.1 මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරු සඳහා සම්මත කොන්ත්‍රාත් අවශ්‍යතාවන්ට වඩා ස්ථානීය විශේෂිත නිගමනයන්ගේ අවශ්‍යතාව 13
9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP) 13
9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම 14
9.2 ගොඩනැගිලි/ඉදිකිරීම් සුන්බුන් ඉවත් කිරීමේ ක්‍රමවේදය (හිමිකරුවන්ගේ එකඟතාව ලබා ගැනීම) 14
9.3 ප්‍රජා දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත ක්ෂෙත්‍ර සඳහා අවශ්‍ය වේ 14
9.4 ස්ථානීය විශේෂිත පාරිසරික/සමාජයීය කළමනාකරණ කොන්දේසි 14
9.5 ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ සිදුවන බලපෑම් අවම කිරීම 16
9.5.1 ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුගේ අනුකූලතාව 18
9.5.2 ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණය 17
10. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයනහි අනුමැතිය ලබා ගැනීම 21
10.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 21
10.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ඉඩම් හිමියන්ගේ අනුමැතිය 22
10.3 පෞද්ගලික ඉඩම් හිමිකාරිත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව / නීත්‍යානුකූල ගිවිසුම 22
11. වැඩබිම සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය 23

රූප සටහන් ලැයිස්තුව

සිතියම 01: යෝජිත නායයෑම් ආපදා ස්ථානයට ප්‍රවේශ මාර්ගය 3

ගූවන් ඡායාරූපය 02. යෝජිත නායයෑම් අවදානම් අවමකරණ ස්ථානය හා අවට ප්‍රදේශය 4

ඩ්‍රෝන ඡායාරූපය 03. ඩ්‍රෝන ඡායාරූප මගින් ලබා ගත් හඳුනාගත් ස්ථානයේ බෑවුම සහ උන්නතාංශය 4

ඩ්‍රෝන ඡායාරූපය 04. යෝජිත නායයෑම් අවදානම් අවමකරණ ස්ථානය හා අවට ප්‍රදේශය 5

සිතියම 05: නායයෑම් උපද්‍රව කලාප සිතියමෙහි හඳුනාගත් ස්ථානයේ පිහිටීම 6

ඡායාරූප 6: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංරචකයන් 9

ඡායාරූපය 6 (අ) අස්ථාවර වී ඇති බෑවුම හරහා දිවෙන දෙල්විට - කිරිබත්ගල මාර්ගය 9

ඡායාරූපය 6 (ආ) අස්ථාවර වී ඇති බෑවුම ආසන්නයේ පහළ බෑවුමේ ඇති නිවාස 9

ඡායාරූපය 6 (ඇ) ගෙවතුවල තැන්පත් වී ඇති පෙරළී ආ පාෂාණ කුට්ටි 9

ඡායාරූපය 6 (ඉ) පාෂාණ කුට්ටි අස්ථායී වී ඇති ස්ථානයේ පශළ බෑවුමේ ඇති කඩ නිවාස 9

රූප සටහන 07: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවියහැකි හිතකර සහ අහිතකර බලපෑම් සාරාංශය 9

වගු සටහන් ලැයිස්තුව

වගුව අංක 1: හිතකර බලපෑම් සහ ඒවායේ වැදගත්කම 10

වගුව අංක 02: පිරිසැලසුම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය මාර්ගෝපදේශයන් 14

වගුව 3: E & HS කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය" 16

වගුව 04: ස්ථානීය විශේෂිත E & HS අවමකරණ පියවරයන් 17

වගුව 5: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය 20

වගුව 6: නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බවට වාර්තා, නිගමන සහ අනුමත කිරීම 21

වගුව 07: අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත කාල රාමුව 22

කෙටි යෙදුම්

AIIB	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලි බල මණ්ඩලය
DFC	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
DS	ප්‍රාදේශීය ලේකම්
DWLC	වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
EH & S	පාරිසරික, සෞඛ්‍ය සහ සමාජයීය
E&SU of PMU	ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික සහ සමාජයීය ඒකකය
ESMF	පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව
ESMP	පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම
GN	ග්‍රාම නිලධාරී
GOSL	ශ්‍රී ලංකා ආණ්ඩුව
GSMB	භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
LHS	වම් පස පෙදෙස
NBRO	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
RHS	දකුණු පස පෙදෙස
SLT	ශ්‍රී ලංතා ටෙලිකොම්
SSE & SMP	ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

1. හැඳින්වීම

1.1 ව්‍යාපෘති සාරාංශය

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) ණය ආධාර යටතේ ශ්‍රී ලංකාවේ පළාත් 6කට අයත් දිස්ත්‍රික්ක 11ක ආපදා අධි අවදානම් කලාපවල පිහිටි අස්ථාවර බෑවුම් සඳහා පිළියම් යෙදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරනු ලබයි. එම ව්‍යාපෘතිය AIIB හා ශ්‍රී ලංකා රජයේ නීතිරීති සහ පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු වේ. තවද, AIIB හි පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිමය අවශ්‍යතාව අනුව ව්‍යාපෘතියේ ස්වභාවය සහ එහි ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සැලකිල්ලට ගනිමින් පාරිසරික සහ සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් (ESMF) නිර්මාණය කළ යුතුය.

මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවෙහි (ESMF) අරමුණ වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී AIIB හි ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික හා සමාජයීය ප්‍රඥප්ති පිළිබඳ මාර්ගෝපදේශ සැපයීමය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) නම් කර ඇත. පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව (ESMF) යටතේ සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරන ලද පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ව්‍යාපෘතියට සම්බන්ධ වන සියළුම පාර්ෂවයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි NBRO විසින් අපේක්ෂා කෙරේ. එමගින් ව්‍යාපෘති කාලසීමාව අතරතුර පරිසරයට හා සමාජයට සිදුවන බලපෑම් අවම වනු ඇත.

පාරිසරික හා සමාජයීය සැකැස්ම සහ සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස්වන නිශ්චිත තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. එබැවින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවට (ESMF) අනුව එක් එක් නායයෑම් ස්ථානයට අදාළව පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) සැකසිය යුතුය. මෙම ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමනාකරණය පිළිබඳ සැලසුම් මගින් විශේෂිත පිළිසකර ක්‍රමවේදයන්, සෞඛ්‍ය, සමාජ සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබඳව ඉදිකිරීම් හා මෙහෙයුම් කාලය තුළ අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙනු ඇත.

පල්ලෙකඩ, දෙල්විට (දෙල්විට - කිරිබත්ගල මාර්ගය) නායයෑම් අවදානම් අවමකරණ ස්ථානයට අදාළ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම පහත දැක්වේ. ප්‍රදේශයේ පාරිසරික හා සමාජයීය සාධකයන් පිළිබඳව සිදු කළ පුළුල් අධ්‍යයනයකින් පසු මෙම සැලැස්ම සකස් කර ඇත.

i. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට හසුවන ප්‍රදේශය තුළ පවත්නා සංවේදී පාරිසරික හා සමාජයීය ලක්ෂණයන් හඳුනා ගැනීම
ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් මත සිදුවිය හැකි සුවිශේෂී පාරිසරික හා සමාජයීය බලපෑම් හඳුනා ගැනීම
iii. යෝග්‍ය ආපදා අවදානම් අවමකරණ පියවරයන් හඳුනාගැනීම
iv. මෙම ව්‍යාපෘතිය යටතේ යෝග්‍ය පාරිසරික හා සමාජයීය අවශ්‍යතාවන් තීරණය කිරීම
v. මෙම ව්‍යාපෘතියට අදාළව අනුගමනය කළ යුතු පාරිසරික හා සමාජයීය රෙගුලාසි සහ විධි විධාන පිළිබඳ අධ්‍යයනය කිරීම

1.2 අපේක්ෂිත පරිශීලකයින්

යෝජිත ව්‍යාපෘතිය සහ අවදානම් අවමකරණ පියවරයන් හේතුවෙන් ඇතිවිය හැකි ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ ගැටලු පිළිබඳ විස්තරයක් මෙම ලේඛනය තුළින් ඉදිරිපත් කරනු ලබයි. ව්‍යාපෘතිය යටතේ පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවෙහි (ESMF) සංරචක ක්‍රියාත්මක කරනු ලබන පිරිසැලසුම් කණ්ඩායම (Design team), ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ කොන්ත්‍රාත්කරු මෙම සවිස්තරාත්මක ලේඛනය පරිශීලනය භාවිත කරනු ඇත. ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි වෙබ් අඩවියේ (NBRO) සහ AIIB වෙබ් අඩවියෙහි ප්‍රදර්ශනය කරන අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වනු ලබන පාර්ශවයන්ට (මහජනතාවට හෝ වෙනත් පාර්ශවකරුවන්ට) ඒවා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. එසේම, මෙමගින් වැඩ ආරම්භ කිරීමට ප්‍රථමව කොන්ත්‍රාත්කරු විසින් සකස් කරනු ලබන පාරිසරික හා සමාජයීය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් වන ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම්වලට අවශ්‍ය පදනම නිර්මාණය කරනු ඇත.

2. ව්‍යාපෘතියේ සහ ස්ථානයේ විස්තරය

2.1 ව්‍යාපෘතියේ නම

ආපදා අවදානම් ස්ථානීය අංක 47, පල්ලේකඩ - දෙල්විට (දෙල්විට - කිරිබත්ගල පාර) කුරුණෑගල දිස්ත්‍රික්කය

2.2 ස්ථානීය විස්තර

යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානය පල්ලෙකඩ - දෙල්විට (දෙල්විට - කිරිබත්ගල පාර) පිහිටා ඇත. මෙම ස්ථානය වයඹ පළාතෙහි කුරුණෑගල දිස්තික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලෙකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත.

ආපදා අවමකරණ ස්ථානයේ GPS ඛණ්ඩාංක - 7.503184°N - 80.552224°E

වැඩබිමට ආසන්නතම නගරය - මෙම වැඩබිම දෙල්විට නගරයට කි.මී. 9ක් දුරින් පිහිටා ඇත.

2.3 ප්‍රවේශ මාර්ගය

දෙල්විට නගරය රිදීගම නගරයේ සිට කි.මී. 9ක් පමණ දුරින් සහ කුරුණෑගල නගරයට කි.මී. 24ක් දුරින් පිහිටා ඇත. දෙල්විට නගරයේ සිට පල්ලෙගහහේන මාර්ගයේ මීටර් 800ක් පමණ දුරින් දෙල්විට රෝහල පිහිටා ඇත. දෙල්විට රෝහල මංසන්දියට මාර්ග 3ක් සම්බන්ධ වන අතර පල්ලෙකඩ - දෙල්විට ආපදා අවමකරණ ස්ථානය මෙම මංසන්දියේ සිට කිරිබත්ගල මාර්ගයේ කි.මී. 1.3ක් දුරින් පිහිටා ඇත.



සිතියම 01: යෝජිත නායයෑම් ආපදා ස්ථානයට ප්‍රවේශ මාර්ගය

2.4 භූ විද්‍යාත්මක ස්වභාවය සහ ඉඩම් හිමිකාරිත්වය

යෝජිත ආපදා අවමකරණ ස්ථානය දෙල්විට නගරයේ සිට කි.මී. 9ක පමණ දුරින් පල්ලේකඩ - දෙල්විට (දෙල්විට - කිරිබත්ගල මාර්ගය) ස්ථානයේ පිහිටා ඇත. බෑවුම් අස්ථාවර වීමේ බලපෑම වර්ග මීටර් 400ක ප්‍රදේශයකට පවතින අතර හඳුනාගත් ස්ථානයේ ඉඩම් හිමිකාරිත්වය පෞද්ගලික අංශයට අයත් වේ. ඡායාරූපය අංක 04 මගින් යෝජිත නායයෑම් ආපදා අවමකරණ ස්ථානය හා අවට පරිසරය පෙන්නුම් කරනු ලබයි.

ගුවන් ඡායාරූපය 02. යෝජිත නායයෑම් අවදානම් අවමකරණ ස්ථානය හා අවට ප්‍රදේශය



ඩ්‍රෝන ඡායාරූපය 03. ඩ්‍රෝන ඡායාරූප මගින් ලබා ගත් හඳුනාගත් ස්ථානයේ බෑවුම සහ උන්නතාංශය

2.5 ප්‍රදේශයේ දේශගුණික හා කාළගුණික තත්ත්වය

උන්නතාංශය - අවදානම් අවමකරණය මුහුදු මට්ටමේ සිට අඩි 1036 (මීටර් 315)

සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය - මි.මී. 2,755

ඩ්‍රෝන ඡායාරූපය 04. යෝජිත නායයෑම් අවදානම් අවමකරණ ස්ථානය හා අවට ප්‍රදේශය දැක්වෙන ඩ්‍රෝන

3. බෑවුම් අස්ථාවර වීම්/ නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු

3.1 සිදුවීම් සංඛ්‍යාව

හඳුනාගත් ආපදා ස්ථානය කණ්ඩි කඩා වැටීමේ අවදානමක් සහිත ස්ථානයකි, ඊට හේතු වී ඇත්තේ මාර්ගය දිගට අවිධිමත් කණ්ඩි කැපීම් සිදු කිරීමත් දුර්වල ජලාපවාහන කළනාකරණ ක්‍රියාවලියත් හේතුවෙනි. 2017 වර්ෂයේ සිට වර්ෂා කාලසීමාවන්හිදී වරින් වර බෑවුම් අස්ථාවර වීම් පිළිබඳ වාර්තා පවතී. සුන්බුන් හා පාෂාණ කුට්ටි විසිරී යමින් බෑවුම චලනය වීම ආරම්භවීමත් සමඟ කණ්ඩි කඩා වැටීම් සිදුව තිබේ. එවැනි අවස්ථාවලදී සුන්බුන්වලින් මාර්ගය වැසීයන අතර රථවාහන ගමනාගමනයට බාධා ඇති කෙරේ. කණ්ඩි අස්ථාවර වීමේ බලපෑම ආසන්න වශයෙන් වර්ග මීටර් 400ක පමණ ප්‍රදේශයකට බලපානු ලබයි.

අස්ථායී බෑවුමෙන් පෙරළී ආ පාෂාණ කුට්ටි ඩී.එම්.ජී. නිමල් ජයරත්න මහතාගේ වෙළෙඳසැල පසෙකින් තැන්පත්ව ඇත. මෙම කඩ නිවාසයෙහි කොන්ක්‍රීට් වහලය මතට පාෂාණ කුට්ටි පෙරළීමෙන් අර්ධ හානි සිදුව ඇත. එම සිදුවීම හේතුවෙන් කිසිදු පුද්ගලයෙකුට හානියක් වී නැත. හානි පූර්ණ වන්දි නොලැබීම හේතුවෙන් හානියට පත්ව ඇති කොටස පිළිසකර කර නොමැති අතර තවදුරටත් ඔවුන් එම නිවසේම පදිංචිව සිටී. ජීවනෝපාය අවස්ථා සහිතව සුරක්ෂිත ස්ථානයක නැවත පදිංචි කිරීමේ විකල්ප අවස්ථාවක් ද ඔවුන්ට ලබා දී නොමැත.



සිතියම 05: නායයෑම් උපද්‍රව කලාප සිතියමෙහි හඳුනාගත් ස්ථානයේ පිහිටීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මෙම ආපදා අවදානම් ස්ථානය සඳහා නිකුත් කරන ලද නායයෑම් අධ්‍යයන වාර්තාව මගින් නිරීක්ෂණ කිහිපයක් ඉදිරිපත් කර ඇත.

- අස්ථායී බෑවුම් කොටස මීටර් 7ක් උස හා මීටර් 10ක් පළලින් යුක්තය
- මෙම ප්‍රදේශය බයෝටයිට් වර්ගයේ පාෂාණවලින් සමන්විත වේ.
- කිරිබත්ගල - දෙල්විට මාර්ගය දිගට ස්ථාන කිහිපයක ගිලා බැසීම් නිරීක්ෂණය කළ හැකිය.

එම වාර්තාවට අනුව කණ්ඩි කඩා වැටීමේ අධි අවදානම් තත්ත්වයට මුහුණ දී ඇති පවුල් 02ක් හඳුනාගෙන ඇති නමුත් සුරක්ෂිත ස්ථානයක නැවත පදිංචි වීමකින් තොරව එම ස්ථානයේම පදිංචිව සිටී.

කෙසේ වුවද, NBRO විසින් සකස් කරන ලද නායයෑම් උපද්‍රව කලාප සිතියම්වල මෙම ප්‍රදේශය දැක්වෙන්නේ නායයෑම් සිදුවීමේ අඩු සම්භාවිතාවක් පවතින කාණ්ඩය යටතේය. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ස්ථානයේ පවතින එකම අවදානම වන කණ්ඩි කඩා වැටීමේ තත්ත්වය ඇතිවී තිබෙන්නේ මාර්ගය ඉදිකිරීමේදී සිදු කරන ලද ඉංජිනේරුමය නොවන බෑවුම් කැපීම් හේතුවෙනි.

3.2 ආපදා අවදානම අවමකරණයට ගෙන ඇති ක්‍රියාමාර්ග

ගම්වාසීන්ට අනුව මාර්ගය දිගට විසිරී තිබූ සුන්බුන් සහ පාෂාණ කුට්ටි රිදීගම ප්‍රාදේශීය සභාව විසින් ඉවත් කර ඇත. එහෙත් මෙම ස්ථානයේ අවදානම අවම කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙනන නොමැත. NBRO වාර්තාව අනුව මෙම ස්ථානයේ ආපදා අවදානම අවම කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග යෝජනා කර තිබේ.

- බෑවුමෙහි ජලය ඉවත් කිරීම සහ මෙම ප්‍රදේශයටම විධිමත් මතුපිට ජල පරිවහන පද්ධතියක් සකස් කිරීම
- ජලය පිටවීමේ සිදුරු සහිතව රැඳවුම් බිත්ති ඉදිකිරීම
- මෙම ස්ථානයට විධිමත් ජලපරිවහන පද්ධතියක් සකස් කිරීම

3.3 ඉවත් කිරීම

වර්ෂා කාලසීමාවන්හිදී මෙම ස්ථානයේ අධි අවදානමට මුහුණ දී ඇති පවුල් ඉවත් කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. එම අධි අවදානමට මුහුණ දී ඇති පවුල්වලට ආරක්ෂිත ස්ථානයකට ගමන් කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නොලැබේ. මෙම පවුල් සමඟ සිදු කල සාකච්ඡාවේදී පැහැදිලි වූයේ වර්ෂා දිනයන්හිදී මඩ සහ සුන්බුන් ඔවුන්ගේ නිවාස වෙත ගලා එන බවයි.

3.4 නැවත පදිංචි කිරීම

අධි අවදානමට මුහුණ දී ඇති පවුලේ (ඩී.එම්.ජී. නිමල් ජයරත්න මහතා) අයට අනුව ඔවුන්ට එම ස්ථානයෙන් ඉවත්වීමට උපදෙස් ලැබී තිබුනද, 2015 වර්ෂයේ සිදු වූ ආපදා හානි සඳහා බලධාරීන් වන්දි ගෙවීමක් නැවත පදිංචි කිරීමේ විකල්ප අවස්ථාවක් හෝ ලබා දී නොමැත. එබැවින් ඔවුන් තවදුරටත් ආපදා අධි අවදානම යටතේ එම නිවෙස්වල පදිංචි වී සිටී.

4. නායයෑම්/ බෑවුම් අස්ථාවර වී ඇති ප්‍රදේශය හා අවට පරිසරය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් තත්ත්වය

4.1 අවට පරිසරයේ ඉඩම් භාවිතය

දෙල්විට ප්‍රදේශය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර නගර සීමාවෙන් දුර ප්‍රදේශයක් බැවින් විසිරුණු ග්‍රාමීය ජනාවාස ලක්ෂණ නිරීක්ෂණය කළ හැකිය. කොස්, තේක්ක, පොල්, මැහෝගනී වැනි හොඳින් වැඩුණු ශාඛ වර්ග නිරීක්ෂණය කළ හැකිය. මෙම ප්‍රදේශයේ බොහෝ පවුල් මූලික හෝ දෙවන ආදායම් මාර්ගයක් ලෙස තම ගෙවතු යොදා ගනු ලබයි.

මෙම ප්‍රදේශය කඳුකර ප්‍රදේශයක් වන බැවින් නිවාස ඉදිකිරීම සඳහා සිදුකර ඇති බෑවුම් කැපීම් කිහිපයක් නිරීක්ෂණය කළ හැකිය. එහෙත් එහිදී නිවැරදි ඉංජිනේරුමය ක්‍රම මගින් බෑවුම් ස්ථාවර කිරීම් සිදුකර නොමැති අතර මතුපිට ජල පරිවහනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කළ හැකිය. දෙල්විට - කිරිබත්ගල මාර්ගය දිගට බෑවුම් කැපීම් කිහිපයක් නිරීක්ෂණය කළ හැකි අතර එම තත්ත්වය ප්‍රදේශයේ අස්ථාවරත්වයට හේතු වී ඇත. අස්ථායී බෑවුම්වලින් පෙරළී ආ මධ්‍යම ප්‍රමාණයේ පාෂාණ කුට්ටි ඩී.එම්.ජී. .නිමල් ජයරත්න මහතාගේ කඩ නිවාසය පසෙකින් පැවතීම දැකිය හැකිය. නිමල් ජයරත්න මහතාට අනුව වර්ෂා කාලයේදී මෙම ප්‍රදේශය හරහා විශාල ජල ප්‍රවාහයනන් ගලා යාම සිදුවේ.

මාර්ගයට සමාන්තරව පහළ බෑවුමේ ඇළ මාර්ගයක් පවතින අතර එම ඇළ මාර්ගයට යාබදව ළිං දෙකක් පිහිටා ඇත. ආසන්න පදිංචිකරුවන් නිවසේ භාවිතය සඳහා ඇළ මාර්ගයේ ජලය භාවිත කරනු ලබයි.

4.2 වර්තමාන අවදානම් මට්ටම

මෙම ස්ථානයේ බෑවුම පිළිසකර නොකරන්නේ නම් අනාගතයේ සිදුවිය හැකි ආපදාවන් හේතුවෙන් දෙල්විට - කිරිබත්ගල මාර්ගයට සහ රථවාහන ගමනාගමනයට ඍජුව බලපෑම් කිරීමට හේතු විය හැකිය. තවද, ඉහළ හා පහළ බෑවුමේ ඇති නිවාසවල පදිංචිකරුවන්ගේ ජීවිත හා දේපොළ සහ ඔවුන්ගේ ජීවනෝපාය ක්‍රමයන්ට බලපෑම් කරනු ලබයි. මෙම ස්ථානයට අදාළ නායයෑම් අධ්‍යයන වාර්තාව අනුව බෑවුම් අස්ථාවර වීමේ අධි අවදානමට මුහුණ දී ඇති පවුල් 02ක් හඳුනාගෙන ඇති අතර තවමත් ඔවුන් එම ස්ථානයේම පදිංචි වී සිටී.

5. ව්‍යාපෘතිය යටතේ යෝජිත අවදානම් අවමකරණ පියවරයන් පිළිබඳ විස්තරය

යෝජිත නායයෑම් ආපදා අවදානම් අවමකරණ පියවර මගින් මෙම ස්ථානයේ අනාගතයේ ඇතිවිය හැකි පාංශු කොටස් අස්ථාවර වීම්/ බෑවුම් අස්ථාවර වීම් වැළැක්වීම අපේක්ෂා කෙරේ. හඳුනාගත් ස්ථානය කණ්ඩි අස්ථාවර වීමේ අවදානම් සහිත ස්ථානයක් වන බැවින් පාංශු වැරගැන්වුම්, බෑවුම නැවත සකස් කිරීම, තෘණ වැවීම, පෘෂ්ඨීය හා උප පෘෂ්ඨීය ජලපරිවහනය ක්‍රමවත් කිරීම වැනි ආපදා අවමකරණ පියවරයන් ක්‍රියාත්මක කරනු ලබයි.

6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන්

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවදානමට ලක්විය හැකි සංරචකයන් හා සේවා පහසුකම්

- මාර්ගයේ ගමන් ගන්නා රථවාහන සහ මාර්ගයේ ගමන් ගන්නා පදිකයින් සහ මගීන්
- පහළ බෑවුමේ ඇති ගෙවතු
- බෑවුම් අස්ථාවර වීම් අවදානමට මුහුණ දී ඇති නිවාස සහ පදිංචිකරුවන්
- ප්‍රදේශයේ වර්තමාන සේවා සහ ආර්ථික ක්‍රියාකාරකම්

ඡායාරූපය 6 (අ) අස්ථාවර වී ඇති බෑවුම හරහා දිවෙන දෙල්විට - කිරිබත්ගල මාර්ගය	*ඡායාරූපය 6 (ආ) අස්ථාවර වී ඇති බෑවුම ආසන්නයේ පහළ බෑවුමේ ඇති නිවාස*
ඡායාරූපය 6 (ඇ) ගෙවතුවල තැන්පත් වී ඇති පෙරළී ආ පාෂාණ කුට්ටි	*ඡායාරූපය 6 (ඉ) පාෂාණ කුට්ටි අස්ථායී වී ඇති ස්ථානයේ පශල බෑවුමේ ඇති කඩ නිවාස*

ඡායාරූප 6: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංරචකයන්

7. ව්‍යාපෘතියට අදාළ අවදානම් සහ සමාජයීය හා පාරිසරික බලපෑම් හඳුනා ගැනීම

ව්‍යාපෘති ක්‍රියාකාරම් හේතුවෙන් සිදුවිය හැකි ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් සහ ඒවායේ වැදගත්කම පහත වගුව මගින් සාරාංශ කර දැක්විය හැකිය.



රූප සටහන 07: ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි හිතකර සහ අහිතකර බලපෑම් සහ වැදගත්කම පිළිබඳ සාරාංශය

7.1 ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම

මෙම ව්‍යාපෘතිය මගින් යෝජිත නායයෑම් ආපදා අවමකරණ පියවරයන් මගින් දෙල්විට කිරිබත්ගල මාර්ගයේ ස්ථානයේ ඇතිවිය හැකි බෑවුම් අස්ථාවර වීම් වැළැක්වීම අරමුණු කෙරේ. මෙම පයවරයන් ක්‍රියාත්මක කිරීම

- මගින් මෙම මාර්ගයේ රථවාහන ගමනාගමනයේ අඛණ්ඩතාව සහ ගමන්කරන්නන්ගේ සහ මගීන්ගේ ආරක්ෂාව තහවුරු කරනු ලබයි. විශේෂයෙන් මෙම තත්ත්වය වර්ෂා සමයන්හිදී වඩාත් වැදගත්වේ.
- නිවාස 02ක් කණ්ඩි කඩා වැටීමේ අධි අවදානම් ලෙස හඳුනාගෙන ඇත. ආපදා අවමකරණ පියවරයන් මගින් මෙම පවුල් සහ ඔවුන්ගේ ජීවනෝපාය ක්‍රමවල සුරක්ෂිත භාවය තහවුරු කරනු ලබයි.
- මෙම ස්ථානයේ අනාගතයේ ඇතිවිය හැකි බෑවුම් අස්ථාවර වීම් හේතුවෙන් මාර්ගය වරින් වර ප්‍රතිසංස්කරණය කිරීමට පිරිවැයක් දැරීමට සිදු නොවීම

7.2 අහිතකර බලපෑම

යෝජිත ආපදා අවදානම් අවමකරණ පියවරයන් අස්ථාවර වී ඇති බෑවුම් ප්‍රදේශයට පමණක් සීමා වේ. එබැවින් මෙම ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවිය හැකි අහිතකර බලපෑම් මෙම ස්ථානයට සහ ඉදිකිරීම් කාලයට පමණක් සීමාවේ.

වගුව අංක 1: හිතකර බලපෑම් සහ ඒවායේ වැදගත්කම

ඉදිකිරීම් කාලය අතරතුර සිදුවන බලපෑම්	**බලපෑමේ ස්වභාවය**
7.2.1 ජල මූලාශ්‍රයන්ට සිදුවිය හැකි බලපෑම	
7.2.1.1 මතුපිට ජලයේ ගුණත්වයට සිදුකරන බලපෑම මෙම ස්ථානයට ආසන්නයෙන් පහළ බෑවුමේ ඇළ මාර්ගයක් පවතින අතර ආසන්න පදිංචිකරුවන් තම දෛනික ජල අවශ්‍යතා සඳහා ඇළ මාර්ගයෙන් ජලය ලබා ගනී. බෑවුම් ස්ථායීකරණ හා ස්ථානය සකස් කිරීමේ කටයුතුවලදී සුන්බන් ඉවත් කිරීම සහ පාෂාණ කුට්ටි ඉවත් කරන බැවින් බාදනය වන පාංශු කොටස් පහළ ඇළ මාර්ගයේ තැන්පත් වීමක් සිදුවිය හැකිය. යන්ත්‍ර සූත්‍රවලින් සහ තාවකාලික ගබඩාවන්ගෙන් තෙල් සහ වෙනත් හානිකර රසායනික ද්‍රව්‍ය කාන්දු වීම සහ අවිධිමත් ලෙස බැහැර කිරීම, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම, අපජලය බැහැර කිරීම යනාදිය හේතුවෙන් පහළ පිහිටි ඇළ මාර්ගය ඇතුළු ජල මූලාශ්‍රයන්ට අහිතකර බලපෑම් එල්ල විය හැකිය. මෙම තත්ත්වය හේතුවෙන් ඇළ මාර්ගයට රොන් මඩ එකතු වී ජලය දූෂණය වීම සහ ජලාශ්‍රිත පද්ධතීන්ට අහිතකර බලපෑම් ඇති විය හැකිය.	**වැදගත්**
7.2.1.2 විවෘත මලපහ කිරීම සහ ජලය ආශ්‍රයෙන් පැතිරිය හැකි රෝග තත්ත්වයන් මෙම වැඩබිම මානව ජනාවාස ආසන්නයේ පිහිටා ඇති බැවින් විව විවෘත මලපහ කිරීම් පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන් ඇතිවීමේ සම්භාවිතාව අවම මට්ටමක පවතී.	**වැදගත් නොවේ**
7.2.1.3 පහළ බෑවුමේ ජල මූලාශ්‍ර භාවිත කරන්නන්ට සිදුවන බලපෑම 7.2.1.1 හි සඳහන් සාධක හේතුවෙන් පහළ බෑවුමේ ජල මූලාශ්‍ර දූෂණය වීමක් සිදු වන්නේ නම් එම ජල මූළාශ්‍ර භාවිත කරන්නන්ට අහිතකර ලෙස බලපානු ඇත.	**වැදගත්**
7.2.1.4 ජල රථාවන්ට සහ ගුණත්වයට සිදුවන බලපෑම	**වැදගත් නොවේ**

මෙම ස්ථානය ජල උල්පත් සහිත ස්ථානයක් නොවන බැවින් ඉදිකිරීම් කටයුතු සඳහා ජලය ඉවත් කිරීම අවශ්‍ය නොවන අතර භූගත ජල මූලාශ්‍රයන්ට බලපෑමක් සිදු නොවේ.	
7.2.2 පාරිසරික බලපෑම	
7.2.2.1 ශබ්දය හා කම්පන පාලනය ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර භාවිතයේදී ශබ්දය හා කම්පන ඇතිවිය හැකිය. මෙම වැඩබිම ග්‍රාමීය ප්‍රදේශයක පිහිටා ඇති බැවින් ප්‍රදේශය නිහඬ හා නිස්කලංක ස්වභාවයක් පවතී. එබැවින් වැඩබිම කටයුතු හේතුවෙන් විශාල ශබ්ද ඇතිවිය හැකිය. පදිකයින්ට හා මාර්ගයේ ගමන් ගන්නා පුද්ගලයින්ටද මෙම ශබ්දය හා කම්පන තත්ත්වය අහිතකර ලෙස බලපානු ඇත. ඩී.එම්.ජී. නිමල් ජයරත්න මහතාගේ කඩ නිවාසයට පාෂාණ කුට්ටි වැටීම නිසා සිදු වූ ඉරිතැලීම් නිරීක්ෂණය කළ හැකිය. එම නිවස අස්ථායී බෑවුම් ප්‍රදේශයේ පිහිටා ඇති බැවින් වැඩබිම් ක්ම්පන හේතුවෙන් නිවසේ ඉරිතැලීම් තවදුරටත් වැඩිවිය හැකිය.	**වැදගත්**
7.2.2.2 පිපුරුම් සහ අන්තරායකර ද්‍රව්‍ය හඳුනාගත් ස්ථානයෙහි පාෂාණ කුට්ටි පවතින බැවින් අවශ්‍ය අවස්ථාවන්හිදී ඒවා පිපිරවීම් සිදු කිරීමට සිදුවේ. අස්ථායී බෑවුම තුළ මෙම පිපුරුම් සිදුකරන බැවින් අවිධිමත් ලෙස පිපිරවීම් සිදු කිරීමේ දී පාෂාණ කොටස් හේතුවෙන් අනතරු සිදුවිය හැකිය.	**වැදගත්**
7.2.2.3 වායු දූෂණ බලපෑම භූමිය එළිපෙහළි කිරීම, ඩීසල් එංජින් ක්‍රියාත්මක කිරීම, ඉදිකිරීම් ඉවත් කිරීම සහ සුන්බුන් පිළිස්සීම වැනි තත්ත්වයන් හේතුවෙන් වායු දූෂණයක් සිදුවිය හැකිය. වියලි කාළගුණ තත්ත්වයක් යටතේ වේගයෙන් වාහන ධාවනය කිරීම, බෑවුම් කැපීම් හා පිරවීම් සහ අවිධිමත් ලෙස සුන්බුන් ප්‍රවාහනය හා ගබඩා කර තැබීම මෙම තත්ත්වය වැඩි කිරීමට හේතුවිය හැකිය. ඉදිකිරීම් කටයුතු සඳහා භාවිත කරනු ලබන ද්‍රව්‍ය; සිමෙන්ති, කොන්ක්‍රීට්, දැව, පාෂාණ සහ සිලිකා වැනි දේ හේතුවෙන් දුහුවිලි නිර්මාණය විය හැකිය. මේ හේතුවෙන් සිදුවන වායු දූෂණය වැඩබිමට ආසන්නව පදිංචිකරුවන්ට සහ මාර්ගය භාවිත කරන්නන්ට අහිතකර ලෙස බලපානු ඇත.	**වැදගත්**
7.2.2.4 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම ඉදිකිරීම් කාල පරිච්ඡේදය තුළදී ශ්‍රමිකයින් විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සහ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ඇතිවන අපද්‍රව්‍ය වශයෙන් ඝන අපද්‍රව්‍ය ආකාර දෙකකට ඇතිවිය හැකිය. විධිමත් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොමැති විට එම අපද්‍රව්‍ය හේතුවෙන් පාංශු, ජල සහ වායු දූෂණයක් සිදුවිය හැකි අතර එය වැඩබිම ආශ්‍රිත පරිසරය දූෂණයට හේතු විය හැකිය. ඉදිකිරීම් ක්‍රියාවලිය ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර නොමැති නම් මෙම ගැටලුව ඉහළ යා හැකිය.	**වැදගත්**
7.2.3 පාරිසර විද්‍යාත්මක බලපෑම	
7.2.3.1 ශාඛවලට සිදුවන බලපෑම මෙම ප්‍රදේශයේ කොස්, තේක්ක, පොල්, මැහෝගනී, සපු වැනි හොඳින් වැඩුණු ශාඛ පවතින අතර එම ශාඛවලින් බහුතරයක් ශාඛ ආවේණික, තර්ජනයට ලක්ව ඇති හෝ IUCN විසින් රතු දත්ත පොතට ඇතුළත් කර නොමැති ශාඛ වේ. ආසන්න පදිංචිකරුවන් බහුතරයක් තම මූලික හෝ ද්විතීයික ආදායම් මාර්ගයක් වශයෙන් ඔවුන්ගේ ගෙවතු භාවිත කරනු ලබයි.	**වැදගත්**

7.2.3.2 වනජීවී වාසස්ථානවලට සිදුවන බලපෑම ව්‍යාපෘති භූමිය ප්‍රකාශයට පත්කරන ලද වන සංරක්ෂණ කලාපයකට අයත් නොවේ. මෙම ප්‍රදේශය ශාඛ ගහනයකින් යුක්ත බැවින් ඉදිකිරීම් කටයුතු හේතුවෙන් වන වැස්ම ඉවත් කිරීමේදී මෙම ප්‍රදේශයේ වාසස්ථාන තනා ගෙන ඇති වනජීවීන්ට අහිතකර ලෙස බලපානු ඇත. ඉදිකිරීම් කටයුතුවල නිරත වී සිටින ශ්‍රමිකයින් වන සතුන් දඩයම් කිරීමට හෝ සංරක්ෂිත පැළෑටි සතුන් වැනි දේ ඒකරාශී කිරීම වැනි කටයුතු වල නිරත වීමට හැකියාව පවතී. ශාඛ හා තෘරුලතා ආරක්ෂණ පනතින් ආවරණය වී ඇති එවැනි කටයුතු සිදු කිරීම තහනම් කොට ඇති අතර පාරිසරික සම්පත්වලට හානිකර විය හැකිය. එබැවින් එම බලපෑම බෙහෙවින් සැලකිය යුතු කරුණකි.	**වැදගත්**
7.2.4 සමාජ ආර්ථික බලපෑම	
7.2.4.1 පහළ බෑවුමේ පිහිටා ඇති නිවාසවලට සිදුවන බලපෑම බෑවුම් අස්ථාවර වී ඇති ප්‍රදේශය ආසන්නයේ නිවාස 2ක් පිහිටා ඇත. ඉදිකිරීම් කටයුතු සඳහා බර යන්ත්‍රෝපකරණ භාවිතයේදී කම්පන ඇතිවිය හැකි අතර ඒ හේතුවෙන් මෙම ගොඩනැගිලිවල ඉරිතැලීම් ඇතිවිය හැකිය.	**වැදගත්**
7.2.4.2 ජීවනෝපාය සහ ආදායම් ඉපයීමේ කටයුතු සඳහා සිදුවන බලපෑම වැඩබිම දෙල්විට - කිරිබත්ගල මාර්ගය ආසන්නයේ පිහිටා ඇති බැවින් ජීවනෝපාය ක්‍රම, ව්‍යාපාර හෝ ආදායම් මූලාශ්‍ර වෙත සැලකිය යුතු බලපෑමක් සිදු කරනු ඇත. මෙම මාර්ගය ප්‍රදේශවාසීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන නගරය වෙත ගෙන යාමටත් නගරයේ සිට භාණ්ඩ හා සේවා ප්‍රදේශවාසීන් වෙත ගෙන යාමටත් භාවිත කෙරේ. වැඩබිමේ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් මාර්ගයේ රථවාහන ගමනාගමනයට බාධා ඇතිවන බැවින් ප්‍රදේශයේ ආදායම් මූලාශ්‍රයන්ට සැලකිය යුතු බලපෑමක් එල්ල වනු ඇත.	**වැදගත්**
7.2.4.3 ඉදිකිරීම් අතරතුර පුද්ගලයින් වැඩබිමට ප්‍රවේශ වීම නේවාසිකයින් සහ පදිකයින් ගමන් ගන්නා වැඩබිම තුළ බර යන්ත්‍රෝපකරණ භාවිතය සිදුවේ. එවැනි යන්ත්‍රෝපකරණ සඳහා අධි වෝල්ටීයතාව සහිත විදුලිය භාවිත කරනු ලබයි. ඉදිකිරීම් ද්‍රව්‍ය අවිධිමත් ආකාරයෙන් භාවිත කිරීම හා ගබඩා කිරීම හේතුවෙන් අනතුරු සිදුවිය හැකිය. වැඩබිමට ආසන්නව පදිංචි කුඩා දරුවන් වැඩබිමේ යන්ත්‍ර සූත්‍ර සහ ඉදිකිරීම් ද්‍රව්‍ය වෙත ආකර්ශනය විය හැකි අතර වැඩබිම් සේවකයින්ගේ අනුදැනුමකින් තොරව එම දරුවන්ට අනතුරු සිදු විය හැකිය. වෙනත් පුද්ගලයින් වැඩබිමට ඇතුළු වීම නොසලකා හැරීම සහ අපරීක්ෂාකාරී ලෙස යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම හේතුවෙන් බරපතළ අනතුරු සිදුවිය හැකිය.	**වැදගත්**
7.2.4.4 වැඩබිම් ඒකක සහ අනෙකුත් අවශ්‍යතා වැඩබිම් ඒකක සඳහා සාමාන්‍යයෙන් තෝරාගනු ලබන්නේ ආසන්න ප්‍රජාවට සමීප ස්ථානයකි. එබැවින් වැඩබිම් ඒකක මනාව කළමනාකරණය නොකළහොත් ශ්‍රමිකයන් පිළබඳ ගැටලු, ආසන්න ප්‍රජාව සමග ගැටලු, පොදු පහසුකම් භාවිතය පිළිබඳ ගැටලු සහ කසල කළමනාකරණය පිළිබඳ ගැටලු වැනි ගැටලුකාරී තත්ත්වයන් ඇතිවිය හැකිය. තාවකාලික වැඩබිම් ඒකක ආපදා අවමකරණ ස්ථානය ආසන්නයේම පිහිටුවා ඇති විටක ඝන අපද්‍රව්‍ය සහ මලාපවාහන සම්බන්ධ ගැටලු ඇතිවිය හැකිය.	**වැදගත්**

7.2.4.5වැඩබිම් සේවකයින් සහ ප්‍රජාව අතර සම්බන්ධතා හා ගැටුම් ඇතිවීම වැඩබිම සඳහා යොදා ගනු ලබන ශ්‍රමිකයින් විවිධ ප්‍රදේශ සහ සමාජ පරිසරවලින් පැමිණෙන අයවළුන් වන අතර සාමාන්‍යයෙන් අඩු අධ්‍යාපන මට්ටමක් සහ නොදියුණු සමාජ පසුබිමක් සහිත වූවන් වේ. එබැවින් දුම්රිය කාර්ය මණ්ඩල, මගීන් සහ වැඩබිමට ආසන්න පදිංචිකරුවන් සමග ගැටලුකාරී තත්ත්වයන් ඇතිවිය හැකිය. එවැනි ගැටලුකාරී තත්ත්වයන් අවම වුවත් සිදුවීම් කිහිපයක් වුවද නොසලකා නොහැරිය යුතුය.	**වැදගත්**
7.2.4.6 ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව ශ්‍රමිකයින්ගේ නොසැලකිල්ල මත බරපතළ අනතුරු ඇතිවිය හැකිය. ඉතා සීමිත ඉඩකඩක් තුළ ඉදිකිරීම් යන්ත්‍ර භාවිතයේදී ද අනතුරු ඇති වීමේ හැකියාවක් පවතී. මෙම වැඩබිබිමෙහි රථවාහන සහ ඉදිකිරීම් යන්ත්‍රවලින් සිදුවිය හැකි අනතුරු ද සිදුවීමේ හැකියාව පවතී. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් සඳහා ළමා ශ්‍රමිකයින් යොදා ගතහොත් එය දැඩි අවදානම්කාරී හා අනතුරුදායී කටයුත්තක් බවට පත්වේ. වැඩබිම තුළ ඉන්ධන ගබඩා කර පවතින් බැවින් ඒවාට ආසන්නයෙන් ගිනි දැල්වීම් සිදු කිරීම් හේතුවෙන් පිපුරුම් සිදුවීමට හැකියාව පවතින අතර ශ්‍රමිකයින්ට අනතුරුදායී කලාපයක් බවට පත්විය හැකිය.	**වැදගත්**
7.2.4.7 රථවාහන සහ මගීන්ට සිදුවන අවහිරතා ආපදා අවමකරණ වැඩබිම පිහිටා ඇත්තේ දෙල්විට - කිරිබත්ගල මාර්ගයේ පිහිටා ඇත. මෙම මාර්ගය ඔස්සේ වැඩබිම සඳහා යන්ත්‍රෝපකරණ සහ ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය හේතුවෙන් අනෙකුත් රථවාහන ධාවනයට සැලකිය යුතු අවහිරතාවක් ඇතිවිය හැකිය.	**ඉතා වැදගත්**

8. පාරිසරික සමාජයීය බලපෑමේ වැදගත්කම

NBRO විසින් පාරිසරික හා සමාජයීය බලපෑම හෝ අවදානම පිළිබඳව පුළුල් අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

8.1 මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරු සඳහා සම්මත කොන්ත්‍රාත් අවශ්‍යතාවන්ට වඩා ස්ථානීය විශේෂිත නිගමනයන්ගේ අවශ්‍යතාව

මෙම වැඩබිම බැවුම් අස්ථායී වීමේ අවදානම පවතින අස්ථාවර බැවුමක පිහිටා ඇති බැවින් ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුය. එවැනි පොදු සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු පිළිබඳව පිළිබඳව ESMF හිදී අවධානය යොමු කොට ඇත. ලංසු ලේඛනයේ 2003 හි වැඩ කිරීමේ කොන්දේසි සහ ප්‍රජා සුරක්ෂිතතාව කොටසෙහි 2003:5 ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් අනුකොටසෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP)

7 හා 8 කොටස්වලදී හඳුනාගත් විශේෂිත බලපෑම් හා අවදානම් අවම කිරීම හෝ කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම කොටසින් දැක්වෙන්නේ පිරිසැලසුම්, ඉදිකිරීම් සහ නඩත්තු මෙහෙයුම් අදියරයන්ට අදාළව ESMP හි දැක්වෙන ස්ථානීය විශේෂිත නිර්දේශ සහ අවශ්‍යතාවන්ය.

9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම වැඩබිමට අදාළව නැවත පදිංචි කිරීම් සිදු කිරීමට අවශ්‍යතාවක් ඇති නොවේ. ගල් පෙරළීමේ අවදානමට මුහුණ දී ඇති කඩ නිවාසයක් හඳුනාගත් ස්ථානය ආසන්නයේ පිහිටා ඇති අතර මෙම ස්ථානයෙන් ඉවත් වීමට ඔවුන්ට උපදෙස් ලබා දී ඇති නමුත් තවමත් අවදානම යටතේ ජීවත් වේ. ඉදිකිරීම් කටයුතු සඳහා භාවිත කරන යන්ත්‍ර හේතුවෙන් කම්පන ඇතිවීම එම නිවාසයෙහි ව්‍යුහයන්ට හානි වීමට හේතු විය හැකිය. (ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ජීවනෝපාය ක්‍රමයන්ට හානිවීමක් සිදුවන්නේ නම් ඊට අදාළ වන්දි පිරිනැමීම පිළිබඳ ESMF හි 7වන කොටස පරිශීලනය කරන්න)

9.2 ගොඩනැගිලි/ඉදිකිරීම් සුන්බුන් ඉවත් කිරීමේ ක්‍රමවේදය (හිමිකරුවන්ගේ එකඟතාව ලබා ගැනීම)

මෙම වැඩසටහන සඳහා අදාළ නොවේ.

9.3 ප්‍රජා දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත ක්ෂෙත්‍ර සඳහා අවශ්‍ය වේ

බෑවුම් ස්ථායීකරණ ක්‍රමවේදයන් පිළිබඳ ආසන්න පදිංචිකරුවන් විශේෂයෙන් වැඩබිමෙහි අසල්වැසි පවුල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

9.4 ස්ථානීය විශේෂිත පාරිසරික/සමාජයීය කළමනාකරණ කොන්දේසි

හඳුනාගත් ස්ථානයේ පාරිසරික හා සමාජයීය තත්ත්වයන් අනුව මෙම වැඩබිම සඳහා පාරිසරික හා සමාජයීය පිරිසැලසුම් මාර්ගෝපදේශ නිර්දේශ කෙරේ.

වගුව අංක 02: පිරිසැලසුම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය මාර්ගෝපදේශයන්

පිරිසැලසුම් අවස්ථා (Design feature)	මෙම වැඩබිම සඳහා සලකා බැලිය යුතු මට්ටම
i. ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් ඵලදායීකරණ පිරිසැලසුම් ව්‍යාපෘති පිරිසැලසුම්කරණයේදී වන වැස්ම විශාල වශයෙන් ඉවත් කිරීම් වැළැත්වීමට සහ වැඩුණු ශාඛ විශේෂ අවම ප්‍රමාණයක් ඉවත් කිරීමට අවධානය යොමු කළ යුතුය. වටිනා ශාඛ විශේෂ පවතින්නේ නම් ඒවා සංරක්ෂණය කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය.	මධ්‍යස්ථයි
ii. වැඩබිම් සැලසුම්කරණය වැඩබිම් සැලසුම්කරණයේදී දුම්රිය මාර්ගයට බෑවුම් අස්ථාවර වීම් සහ පාංශු ස්ථර චලනය සිදුවීමට ඇති විභවතාව පිළිබඳ අවධානය ඉතා වැදගත් වේ. අවදානම් කලාපය තුළ වාහන නැවතුම් පොළවල් ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීම් සහ තාවකාලික වාසස්ථාන ආදිය නොකළ යුතුය.	ඉහළයි
iii. සතුන්ගේ වාසස්ථාන සහ ගමන් මාර්ග යම් ඉදිකිරීමක් හේතුවෙන් විශාල ප්‍රදේශයක වන ව්‍යාප්තිය ඉවත් කිරීමට සිදු වන්නේ නම් සහ ඒ හේතුවෙන් සතුන්ගේ වාසස්ථාන හා ගමන් මාර්ගවලට අවහිරයක් වන්නේ නම් ඒවා සඳහා සම්බන්ධක යෝග්‍ය ක්‍රම පිරිසැලසුම් සිදු කළ යුතුය.	අවමයි

iv. ජල සම්පත් සංරක්ෂණය ඉදිකිරීම් අවශ්‍යතාවක් මත භූගත ජලය ඉවත් කිරීමක් සිදුවන්නේ නම් සහ එම ජලය පිරිසිදු නම් එම ජලය ගෙවතු වගාවන්ට හා සනීපාරක්ෂක වැනි කටයුතු සඳහා භාවිත කළ හැකිය. වැඩබිමට ආසන්නව නිවාස පිහිටා ඇති බැවින් ජලය ලබා ගැනීමේදී එම ජලයේ පිරිසිදු භාවය පිළිබඳ දැඩි අවධානයකා යොමු කළ යුතුය.	අවමයි
v. ජල සැපයුම් හෝ මලාපවහන පද්ධතිවලට අවහිරවීම් පිරිසැලසුම්කරණයේදී වැඩබිමේ ජල සැපයුම් හා මලාපවහන පද්ධති පිළිබඳ අවධානය යොමු කළ යුතු අතර එවැනි පද්ධතිවලට අවහිරතා අවම වන පරිදි පිරිසැලසුම්කරණ නිර්ණායකයන් තෝරා ගත යුතුය.	අවමයි
vi. පාරිසරික අලංකරණය සහිත සැලසුම් සෞන්දර්යාත්මකව සංවේදී පරිසරයක සිදු කරන ඉදිකිරීම්වලදී එම පරිසරයට අනුකූල වන පරිදි ව්‍යුහයන් සලකා බැලිය යුතුය. යෝග්‍ය ආපදා අවදානම අවම කිරීමේ ව්‍යුහයන් සැලසුම් කිරීම සඳහා භූ දර්ශන නිර්මාණ ශිල්පියකුගේ (Landscape architect) සේවය වැදගත් විය හැකිය.	ඉහළයි
vii. හරිත පාරිසරික ලාක්ෂණික පිළිබඳ කොන්දේසි අවදානම් අවමකරණ පියවරයන් බහුතරයක් හරිත පාරිසරික සිදු කරන බැවින් ස්වභාවික ක්‍රම මත පදනම් වූ අවදානම් අවමකරණ ක්‍රමවේද, පරිසරයේ ශාඛ විවිධත්වය ආරක්ෂා වන පරිදි පැළෑටි සංයුතීන් යොදා ගැනීම, ආක්‍රමණික ශාඛ විශේෂිත ව්‍යාප්තිය වැළැක්වීම වැනි හරිත පාරිසරික පිරිසැලසුම්කරණ ක්‍රම සලකා බැලීමට නිර්දේශ කෙරේ.	ඉහළයි
ix. ශ්‍රමිකයින්ගේ සහ ප්‍රජාවගේ ආරක්ෂාව ඉදිකිරීම් අතරතුර භූ චලනයන් සිදුවිය හැකි අතර ශ්‍රමිකයින්ට සහ ආසන්න පදිංචිකරුවන්ට එම තත්ත්වය තර්ජනයක් විය හැකිය. එබැවින් එබැවින් පිරිසැලසුම්කරණයේදී ආරක්ෂිත වැටි, ආරක්ෂිත දැල් වැනි ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.	ඉතා ඉහළයි
x. පාංශු බාදන වැළැක්වීමේ ව්‍යුහයන් වර්ෂා කාල සීමාවන්හිදී අස්ථාවර බෑවුම ඔස්සේ සැලකිය යුතු මට්ටමින් ජලය ගලා යාමේ ප්‍රවාහ ඇතිවිය හැකිය. එබැවින් පාංශු බාදන තත්ත්වය අවම කිරීම සඳහා ජල පහරේ වේගය පාලනය කිරීමේ ක්‍රම ප්‍රමාණාත්ව යොදා ගත යුතු ය.	ඉහළයි
xi. අවම පශ්චාත් නඩත්තු සහ මෙහෙයුම් පිරිසැලසුම් වැසි ජල කාණු පද්ධති සෘජුවම ස්වභාවික ජල මූලාශ්‍රයන්ට යොමු වන්නේ නම් පාංශු බාදනය වැළැක්වීමට අවසාධිත උගුල් වැනි පිරිවැය අවම ක්‍රමවේද සහ සැලසුම් භාවිත කළ යුතුය. මෙම ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය කල්පැවැත්ම සහ කාලගුණික තත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. තවද, පිරිසැලසුම්කරණයේදී විඛාදන වැළැක්වීමේ අඩු පිරිවැය තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ සලකා බැලිය යුතුය.	ඉහළයි

9.5 ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ සිදුවන බලපෑම් අවම කිරීම

9.5.1 ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුගේ අනුකූලතාව

පාරිසරික හා සමාජීය බලපෑම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා ගනු ලබන පියවර සාමාන්‍යයෙන් සියලු නායයෑම් අවදානම් අවමකිරීමේ ස්ථාන වලට පොදු වේ. එසේම එවැනි බලපෑම් බොහෝ දුරට ඉදිකිරීම් සඳහා බලපෑම් එල්ල කරන බැවින් බලපෑම් අවම කිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු කටයුතු කළ යුතුවේ. මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිකිරීම් අදියරයේදී පාරිසරික හා සමාජයීය සෞඛ්‍ය හා ආරක්ෂාව ^E & HS& කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය" පිළිබඳ පුළුල් ලේඛනයක් සකස් කර ඇත. එම ගේඛනයෙහි මෙම ස්ථානයට අදාළ ප්‍රධාන කොටස් පහත දැක්වේ (වගුව 3). විස්තර සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ESMP යොමු කළ යුතුය.

වගුව 3: E & HS කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය"

ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට අනුව ESMP යොමු අංකය	**සංරචකය**	**ව්‍යාපෘතියට අදාළත්වය**
2002. පාරිසරික හා සමාජයීය අධීක්ෂණය		
2002.2 1)	වැඩබිම තුළ ගබඩා කිරීම්	බෙහෙවින් අදාළ වේ
2002.2 2)	ශබ්දය හා කම්පන	බෙහෙවින් අදාළ වේ
2002.2 3)	ගොඩනැගිලිවලට සිදුවන ඉරිතැලීම් සහ හානි	අදාළ වේ (නිවාස)
2002.2 4)	අපද්‍රව්‍ය බැහැර කිරීම	බෙහෙවින් අදාළ වේ
2002.2 5)	අබලි ද්‍රව්‍ය බැහැර කිරීම	බෙහෙවින් අදාළ වේ
2002.2 6)	දුහුවිලි පාලනය	බෙහෙවින් අදාළ වේ
2002.2 7)	ඉදිකිරීම් ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය ප්‍රවාහනය	බෙහෙවින් අදාළ වේ
2002.2 8)	ජලය	අදාළ වේ
2002.2 9)	ශාක හා සත්ත්ව විශේෂ	බෙහෙවින් අදාළ වේ
2002.2 10)	භෞතික හා සංස්කෘතික සම්පත්	අවම වශයෙන් අදාළ වේ
2002.2 11)	පාංශු බාදනය	බෙහෙවින් අදාළ වේ
2002.2 12)	පාංශු දූෂණය	අදාළ වේ
2002.2 13)	පස් හා වැලි ලබා ගැනීම	අදාළ වේ
2002.2 14)	භෞතික හා සංස්කෘතික සම්පත්	අදාළ වේ
2002.2 15)	නඩත්තු වාහන සහ යන්ත්‍ර (දූෂණය)	බෙහෙවින් අදාළ වේ
2002.2 16)	මහජනතාවට සිදුවන අවහිරතා	අදාළ වේ
2002.2 17)	පොදු පහසුකම් සහ යටිතල පහසුකම්	අදාළ වේ
2002.2 18)	පරිසර අලංකරණය වැඩිදියුණු කිරීම	බෙහෙවින් අදාළ වේ
2002-5. පාරිසරික අධීක්ෂණය	මූලික සමීක්ෂණය (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ)	ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න
	ඉදිකිරීම් සිදුකරන අතරතුර සමීක්ෂණ (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ)	ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න
	මෙහෙයුම් කාලසීමාව තුළ සමීක්ෂණ	ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න
	වාර්තා පවත්වාගෙන යාම	අදාළ වේ
2003. සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව		
2003.2	ආරක්ෂාව පිළිබඳ සංවිධානකරණය සහ සන්නිවේදනය	බෙහෙවින් අදාළ වේ
2003.3	ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය	බෙහෙවින් අදාළ වේ
2003.4	ආරක්ෂාව පිළිබඳ වාර්තා සහ අනතුරු දැනුම් දීම	බෙහෙවින් අදාළ වේ
2003.5	ආරක්ෂිත උපකරණ සහ ඇඳුම්	බෙහෙවින් අදාළ වේ
2003.6	ආරක්ෂාව පිළිබඳ නිරීක්ෂණය	බෙහෙවින් අදාළ වේ

2003.7	ප්‍රථමාධාර පහසුකම්.	බෙහෙවින් අදාළ වේ
2003.8	සෞඛ්‍ය සහ ආරක්ෂිත තොරතුරු සහ පුහුණුව	බෙහෙවින් අදාළ වේ
2003.9	යන්ත්‍ර සූත්‍ර සහ පුහුණු ශ්‍රමිකයින්	බෙහෙවින් අදාළ වේ

අදාළ වේ: සෑම ව්‍යාපෘති වැඩබිමකටම අදාළව භාවිත කළ යුතු පොදු ESMP ලෙස මෙම කොටසින් දැක්වේ.

බෙහෙවින් අදාළ වේ: ආපදා අවදානම අවමකරණ ස්ථානයට අදාළව සකස් කරන ලද ESMP ට අනුකූල වන පරිදි පාරිසරික ප්‍රමිතීන් සකස් කිරීමට කොන්ත්‍රාත්කරු විසින් දැඩි අවධානයක් යොමු කළ යුතුය.

අදාළ විය හැකි: ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාව ESMP හි පූරණ අවශ්‍යතා සඳහා මෙය අදාළ විය හැකිය.

අදාළ නොවේ: ස්ථානයේ ස්වභාවය මත මෙම කොටස් අදාළ නොවිය හැකිය.

වෛකල්පිත: අවශ්‍යතාවකදී භාවිත කළ හැකිය.

ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම: මෙම සැලැස්ම තුළ පවත්නා අධීක්ෂණ කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

පරිශීලනය කරන්න: ESMP ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරුගේ වගකීම

9.5.2 ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණය

ඉදිකිරීම් කාලය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණ පියවර පහත දැක්වේ.

වගුව 04: ස්ථානීය විශේෂිත E & HS අවමකරණ පියවරයන්

අවදානම් අවමකිරීමේ සංරචක	ව්‍යාපෘතියේ අදියර	වගකීම
i. ඉදිකිරීම් ක්‍රියාවලිය අතරතුර පාංශු බාදන බලපෑම අවම කිරීම වර්ෂා කාලසීමාවන්හිදී භූමිය එළි පෙහෙළි කිරීම, බෑවුම් සකස් කිරීම, සුන්බුන් ඉවත් කිරීම වැනි කාර්යයන්හි යෙදීම වැළැක්විය යුතු බව නිර්දේශ කරනු ලබයි. විශේෂයෙන් ඉහළ බෑවුමෙහි එවැනි කටයුතු සිදු කිරීම හැකිතාක් වියලි කාළගුණික තත්ත්වයන් යටතේ සිදු කිරීමටත් වැසි සහිත කාලසීමාවන්හිදී හැකිතාක් නොකිරීමටත් අවශ්‍ය විධි විධාන සපයනු ලැබේ. මේ පිළිබඳව ව්‍යාපෘති සැලසුම් කිරීමේ අදියරේදී සලකා බැලිය යුතුය. රොන් මඩ තට්ටු ගැලවී යාම වැළැක්වීම සඳහා යෝග්‍ය ක්‍රමවේද හඳුන්වා දිය යුතුය.	ස්ථානය සකස් කිරීම හා ඉදිකිරීම්	• කොන්ත්‍රාත්කරු
ii. ව්‍යාපෘති කටයුතු සැලසුම් කිරීම වැඩබිම තුළ ඉදිකිරීම් ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් දැඩි අවධානයකින් සැලැස්මක් සකස් කළ යුතුය. එම සැලැස්ම තුළ ආරක්ෂාව සහ වැඩබිමෙහි සීමිත ඉඩකඩ අනුව වාහන නවතා තැබීමේ ස්ථාන, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම, පිරිසිදු කිරීමේ කටයුතු වැනි දේ පිළිබඳව ක්‍රමවේද සැලකිලිමත්ව ඇතුළත් කළ යුතුය.	ස්ථානය සකස් කිරීම හා ඉදිකිරීම්	ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු

iii. ඇතුල් වීම තහනම් කලාපය බෑවුම් ස්ථායීකරණ ඉදිකිරීම් කටයුතුවලදී බෑවුම් අස්ථායී වීම් සිදුවිය හැකිය. එබැවින් PMU විසින් සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් සිදු කර අවශ්‍යතාව මත "ඇතුළු වීම තහනම් ප්‍රදේශයක්" ප්‍රකාශ කළ යුතුය. ඉදිකිරීම් අතර තුර රථවාහන ධාවනයේදී විදුලි කාන්දු වීමකදී වැනි තත්ත්වයන් හේතුවෙන් හදිසි අනතුරු සිදු විය හැකි. එබැවින් වැඩබිම තුළ සෞඛ්‍ය හා අරක්ෂාව පිළිබඳ සැලැසුමට මූලිකත්වය ලබාදිය යුතුය. බෑවුම් අස්ථායී වීම් පිළිබඳව දැනුවත් කිරීමේ සංඥා පුවරු භාවිත කිරීම මෙම වැඩ බිම සඳහා දැඩිව නිර්දේශ කරනු ලැබේ.	ඉදිකිරීම් අදියර	• PMU හි පාරිසරික හා සමාජයීය ඒකකය • කොන්ත්‍රාත්කරු
iv. යන්ත්‍ර හා අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම ඉදිකිරීම් අදියර තුළ අමුද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර හා වාහන ප්‍රවාහනය සඳහා කොන්ක්‍රීට් යෙදූ මාර්ගය භාවිත කිරීමට සිදුවේ. එබැවින් සිදුවිය හැකි අනතුරු සහ මාර්ගයට සිදුවිය හැකි හානි පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු ය.	ඉදිකිරීම් අදියර	• PMU හි පාරිසරික හා සමාජයීය ඒකකය • කොන්ත්‍රාත්කරු
v. ආක්‍රමණික විශේෂිත වැඩබිම ආසන්නයේ රක්ෂිත වනාන්තරයක් පවතින බැවින් පාංශු බාදනය වැළැක්වීම සඳහා ආක්‍රමණකාරී ශාඛ විශේෂ භාවිතයෙන් ශාඛ පද්ධති ව්‍යුහයන් භාවිතය කිසිසේත් නොකළ යුතු ය. අවශ්‍ය අවස්ථාවන්වලදී බාදනය වැළැක්වීම සඳහා දේශීය ශාඛ භාවිත කිරීම කළ යුතුය.	ඉදිකිරීම් අදියර	ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
vi. ශබ්දය හා කම්පන පාලනය වැඩබිම තුළ සිදුකරනු ලබන ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන ශබ්දය හා කම්පන ආසන්න පදිංචිකරුවන්ට බාධාකාරී විය හැකිය. කම්පන ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් වලදී සම්මත කම්පන මට්ටම් තුළ සිදු කළ යුතු අතර කම්පන හේතුවෙන් නිවාස/ගොඩනැගිලි ව්‍යුහයන්ට හා අවට පරිසරයේ වෘක්ෂ ලතාවන්ට හානි සිදු නොවිය යුතුය. නිවෙස්වල පවතින ඉරිතැලීම් පිළිබඳව පූර්ව සමීක්ෂණක් සිදු කළ යුතු අතර ඉදිකිරීම් අතරතුර සහ පසුව නැවත සමීක්ෂණ සිදු කළ යුතුය. ඉදිකිරීම් කටයුතු හේතුවෙන් යම් ගොඩනැගිල්ලකට හානි සිදුවුවහොත් ඊට සුදුසු වන්දි මුදලක් ලබා දිය යුතුය.	ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
vii. ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී කොන්ත්‍රාත්කරු විශේෂ අවධානයක් යොමු කළ යුතුය. මෙම වැඩබිම පිහිටා ඇත්තේ අලංකාරවත් පරිසර පද්ධතියකිනි. එබැවින් එවැනි අපද්‍රව්‍ය ජනනය වන්නේ නම් ඒවා වැඩබිම තුළ සෝදා හැරීම නොකළ යුතු අතර වැඩබිම තුළ විධිමත්ව ගබඩා කර PMU විසින් අනුමත තරනු ලබන ක්‍රමවේදයක් හරහා ඒවා බැහැර කළ යුතුය. එවැනි අපද්‍රව්‍ය මාර්ගය වෙත බැහැර නොකළ යුතුය.	ස්ථානීය සැකසුම් සහ ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
viii. දුහුවිලි සහ වායු දූෂණය පාලනය කිරීම ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවන දුහුවිලි අවට පදිංචි කරුවන්ට, පදිකයින්ට සහ මගීන්ට අහිතකර ලෙස බලපෑම් කළ හැකිය.	ඉදිකිරීම් අදියර	ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු

අධික ලෙස දුහුවිලි අංශු නිකුත් වන අවස්ථාවන්හිදී විශේෂිත ආවරණ මගින් ඒවා පිටතට යාම වැළැක්විය යුතුය.		
ix. ඉදිකිරීම් සඳහා ජලය ඉදිකිරීම් සඳහා ජලය ලබා ගැනීම සිදු කළ යුත්තේ අනුමත ස්ථානවලින් පමණි.	ඉදිකිරීම් අදියර	ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
x. මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු වැඩබිමෙහි සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ වැඩ කිරීමට සිදුවන බැවින්, "සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව" පිළිබඳ ඊඑජ හි කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම පිළිබඳ 2003 වගන්තියේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. විධිමත් සංවිධාන හා නියාමන ක්‍රමවේදයක් යටතේ මෙම නිර්දේශ දැඩි අවදානයකින් ක්‍රියාත්මක කළ යුතුය. i. ඊට අමතරව, අධික වර්ෂා තත්ත්වයන්හි දී ඉහළ බෑවුම අස්ථායී විය හැකි බැවින් ප්‍රමාණවත් කාලසීමාවක් ඉදිකිරීම් කටයුතු නොකළ යුතුය. ii. වැඩබිම් සේවකයින්ගේ හා පදිකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් විධිමත් අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකරුවෙකු යෙදවිය යුතුය. iii. ගල් පෙරලීමෙන් මාර්ගය භාවිත කරන්නන්ට හා ශ්‍රමිකයින්ට සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීම සඳහා ආරෂිත බාධක හා දැල් යෙදීමට නිර්දේශ කෙරේ. iv. වැඩබිම සඳහා හදිසි අවස්ථා කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කළ යුතුය (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂිත උපාංග, රෝහල් ගත කිරීමේ පහසුකම්, ප්‍රවාහණ පහසුකම්).	ඉදිකිරීම් අදියර	• PMU හි පාරිසරික හා සමාජයීය ඒකකය • කොන්ත්‍රාත්කරු
xi. ආරක්ෂණ ව්‍යුහයන්/ දැන්වීම් පුවරු ඉහළ බෑවුමේ සිට ශ්‍රමිකයින් වැටීමෙන් සිදුවිය හැකි අනතුරු වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂිත වැටක් ඉදිකළ යුතුය. බෑවුම අස්ථායී වීමේ අවදානම පිළිබඳ සංඥා පුවරු අවදානම් ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කළ යුතු ය. වර්ෂා තත්ත්වයන්හිදි ඉදිකිරීම් කටයුතු සිදු කිරීම අවදානම් වන බැවින් එවැනි කටයුතු කළ යුතු ය. කෙසේ වුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී ද එම ආරක්ෂණ සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ.	ඉදිකිරීම් අදියර	• PMU හි පාරිසරික හා සමාජයීය ඒකකය • කොන්ත්‍රාත්කරු
xii. ජල සැපයුම් පද්ධතිවලට සිදුවන බලපෑම අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී ජල සැපයුම් පද්ධතිවලට බලපෑම් සිදුවන්නේ නම් විකල්ප ජල සැපයුම් පද්ධති සැපයිය යුතුය. වැඩබිම හරහා ජල සැපයුම් පද්ධති ගමන් කරන අවස්ථාවක එම නළ පද්ධති වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට අවශ්‍ය වන්නේ නම් ජල සැපයුම් පද්ධතිය භාවිත කරන්නන් දැනුවත් කළ යුතු ය.	ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
xiii. කොන්ත්‍රාත්කරුගේ සේවකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩබිම් සේවකයින් සඳහා වෙන් කරන ලද සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතුය.	ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු

xiv. වැඩකරන කාලය ඉදිකිරීම් කටයුතු දිවා කාලයට පමණක් සිදු කළ යුතු ය. ආරක්ෂිත ගැටලු හේතුවෙන් සවස 6.00න් පසු කිසිදු හේතුවක් මත ඉදිකිරීම් කටයුතු සිදු නොකළ යුතුය.	ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
xv. වැඩබිමට ඇතුළු වීම හෝ ඒ හරහා ගමන් කිරීම දැනුවත් කිරීමේ පුවරු, දැනුවත් කිරීම් සහ පූර්ණ කාලීන මුරකරුගේ විමසිලිමත් භාවය තුළින් වැඩබිමට අනවසරයෙන් ඇතුළත් වීම් වැළැක්විය යුතුය.	ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
xvi. පරිශ්‍රය පිරිසිදුව තබා ගැනීම ඉදිකිරීම් අතර තුර පාරිසරික අලංකාරවත් බවට සිදුවිය බලපෑම අවම කිරීමට කටයුතු කළ යුතුය.	ස්ථානීය සැකසුම් සහ ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු
xvii. සේවක චර්යාධර්ම පද්ධතිය කොන්ත්‍රාත්කරු විසින් යෝග්‍ය සේවක චර්යා ධර්ම පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් වැඩබිම් සේවකයින්, පදිකයින් සහ වෙනත් මාර්ගය භාවිත කරන්නන් අතර ගැටුම් ඇතිවීම වැළැක්විය යුතුය.	ඉදිකිරීම් අදියර	• ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු

9.5.3 මෙම වැඩබිම සඳහා වන අධීක්ෂණ අවශ්‍යතා

පහත දැක්වෙන අධීක්ෂණ සැලැස්ම ඉදිකිරීම් අදියරයේදී මෙම වැඩබිමට විශේෂිත වූ අධීක්ෂණ සැලැස්මකි. මීට අමතරව, කොන්ත්‍රාත්කරුවන්ගේ ESMP සඳහා ඇති අනනුකූලතාව දක්වා ඇති අධීක්ෂණ ක්‍රියා පටිපාටිය ඒ ආකාරයෙන්ම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ESMP ක්‍රියාපටිපාටිය ලංසු ලේඛනයේ සඳහන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්වීමට අවශ්‍ය වේ. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ ප්‍රකාශනය තෝරාගත් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අතර PMU විසින් එය අනුමත කිරීම අවශ්‍ය වේ.

වගුව 5: ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය

අධීක්ෂණ අවශ්‍යතාව	පරාමිතීන්	අධීක්ෂණය කළ යුතු වාර ගණන
i. මූලික අධීක්ෂණය	ජලයේ ගුණාත්මකභාවය	එක්වරක් *
	අවදානමට ලක්ව ඇති නිවාස, රෝහල් සහ පාසල්වල ඉරිතැලීම් සමීක්ෂණය	එක්වරක් *
	භූමිය මත සිදුවන කම්පන	එක්වරක් *
	වාතාශ්‍රයේ ගුණාත්මක භාවය: විශේෂිත සාධක	එක්වරක් *
	වැඩබිම් ශබ්ද මිනුම් කිරීම	එක්වරක් *
ii. ඉදිකිරීම් අතර තුර	ජලයේ ගුණාත්මකභාවය	එක්වරක් *
	පාසල් ගොඩනැගිලිවල ඉරිතැලීම් සමීක්ෂණය	ඉදිකිරීම් අතරතුර සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය වන්නේ නම් **
	භූමිය මත සිදුවන කම්පන	භූ විදුම්, කැණීම් හෝ වෙනත් කම්පන ඇතිකරවන යන්ත්‍ර භාවිතයේදී *

	ඉදිකිරීම් ක්‍රියාවලියෙහි ශබ්දය	අධික ශබ්ද ඇතිවන අවස්ථාවන්වලදී මාසයකට වරක් *
	වාතාශ්‍රයේ විශේෂිත තත්ත්වයන්	මාසයකට වරක් *
iii. රථවාහනවලින් සිදු කරන විමෝචන	වැඩබිම තුළ ක්‍රියාත්මක වන සියලුම යන්ත්‍රෝපකරණ / වාහන සඳහා විමෝචන පාලන පරීක්ෂණ සහතිකය තිබිය යුතුය - වැඩබිමෙහි ES නිලධාරී විසින් පරීක්ෂා කළ යුතුය.	
iv. අධීක්ෂණ නියෝජිතායතන	*ඉරිතැලීම් සමීක්ෂණ හැර අනෙකුත් සියලුම සංරචකයන් අධීක්ෂණය කිරීම සඳහා මධ්‍යම පාරිසරික අධිකාරියේ ලියාපදිංචි කර ඇති තරඟකාරී ස්වාධීන අධීක්ෂණ ආයතනයක් **ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ සිදු කිරීම සඳහා ඡඵඹ හි ලියාපදිංචි නියෝජිතායතනයක් විසින් සිදු කළ යුතුයි	
v. වාර්තා කිරීමේ අවශ්‍යතා	**ස්වභාවික ඇළ මාර්ගවල ජලයේ ගුණාත්මක භාවය** - CEA විසින් 2017 වර්ෂයේ පළ කරන ලද ස්වභාවික ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ පරාමිතීන් සමග සන්සන්දනය කිරීම **අවදානමට මුහුණ පා ඇති නිවාසවල මූලික ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණය** - වෘත්තීමය වාර්තා **භූමියේ කම්පන තත්ත්ව** - CEA විසින් ඉදිකිරීම්, රථවාහන ධාවනය සහ යන්ත්‍රෝපකරණ මගින් සිදුවන තාවකාලික කම්පන තත්ත්ව පිළිබඳව සම්මතයන්ට අනුව **පසුබිම් ශබ්ද මිනුම් කිරීම** - CEA විසින් 1996 මැයි 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය **වායු ගුණාත්මකභාවය පිළිබඳ කරුණු - ජාතික වායු ගුණාත්මකභාවය පිළිබඳ සම්මතයන් දැක්වෙන 2008 අගෝස්තු 15 දිනැති අංක 1562/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය**	

10. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයනහි අනුමැතිය ලබා ගැනීම

වගුව 6: නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බවට වාර්තා, නිගමන සහ අනුමත කිරීම

අවශ්‍යතාව/ අනුමත කිරීම/ ආයතනය	ව්‍යාපෘතියට අදාළත්වය
10.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	
දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය	ව්‍යාපෘති යෝජනා මහ ඇමති සහ පාර්ශ්වකරුවන්ගේ නියෝජිත ආයතන ඇතුළත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කර අනුමැතිය ලබා ගත යුතුය. මෙම රැස්වීමේදී PMU හි නිලධාරියා විසින් ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීම, ව්‍යාපෘති තොරතුරු අනාවරණය කිරීම සහ පාරිසරික හා සමාජීය ගැටළු ඇතුළු විවිධ කරුණු සාකච්ඡා කරනු ඇත. පැමිණ ඇති ගැටළු ESMP හි විසඳනු ඇති අතර, මෙම රැස්වීමේදී ගනු ලබන තීරණ සහ නිර්දේශ ඊඑඡ හි සලකා බලනු ලැබේ.
සැලසුම් කමිටුවේ අනුමැතිය	රිදීගම ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම

10.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ඉඩම් හිමියන්ගේ අනුමැතිය	
භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය	ගොඩනැගිලි ද්‍රව්‍ය කැණීම් කිරීම, ප්‍රවාහනය සහ සුන්බුන් බැහැර, පාෂාණ සහ ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය. (අවශ්‍ය නම් පමණක්)
රිදීගම ප්‍රාදේශීය සභාව	අපද්‍රව්‍ය බැහැර කිරීම සහ කොළ රොඩු ඉවත් කිරීම සඳහා පාතහේවාහැට ප්‍රාදේශීය සභාව වෙතින් අනුමැතිය ලබා ගැනේ.
ලංකා විදුලිබල මණ්ඩලය	වැඩබිම් අවශ්‍යතා සඳහා විදුලිය ලබා ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයේ අනුමැතිය.
10.3 පෞද්ගලික ඉඩම් හිමිකාරිත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව / නීත්‍යානුකූල ගිවිසුම	
ඉඩම් හිමිකරු (පුද්ගලික ඉඩම් හිමිකරුවන්)	ව්‍යුහයන් ඉවත් කිරීමට, ඉඩමට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගුකාලීන නඩත්තු කටයුතුවල නිරත වීමට කිසිදු විරෝධයක් නොදක්වන බවට සහ ව්‍යුහයන්ගෙන් වටිනාමක් ඇති ද්‍රව්‍ය ඉඩම් හිමියා වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ලබා ගැනීමට / හෝ නිස්සාරණය කිරීමට ඉඩ ලබා දීම පිළිබඳ ඉඩම් හිමියා සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව ගිවිසුමක් අත්සන් කෙරේ.

අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව වගු අංක 07 හි දක්වා ඇත.

වගුව 07: අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත කාල රාමුව

අනුමැතිය ලබා ගැනීම	මාසය 01				මාසය 02			
	සතිය 01	සතිය 02	සතිය 01	සතිය 02	සතිය 01	සතිය 02	සතිය 01	සතිය 02
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ***දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම*** • ව්‍යාපෘති විස්තර භාරදීම • ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම • ගැටලු නිරාකරණය කර ගැනීම • අනුමැතිය								
සැලසුම් කමිටුවේ අනුමැතිය • ව්‍යාපෘති විස්තර භාරදීම • ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම • ගැටලු නිරාකරණය කර ගැනීම • අනුමැතිය								
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය • ව්‍යාපෘති විස්තර භාරදීම • ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම								

• අනුමැතිය								
වෙනත් අනුමැතීන් ලබා ගැනීම GSMB ආරක්ෂක අමාත්‍යාංශය (අවශ්‍යතාව මත)								

11. වැඩබිම සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය

ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්වන පාර්ශවයන්ගේ (ආසන්න පදිංචිකරුවන්, දෙල්විට - කිරිබත්ගල මාර්ගය භාවිත කරන්නන්) අභියාචනා සලකා බැලීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම PMU හි වගකීමකි (පාරිසරික හා සමාජයීය කළමනාකරණ වැඩසටහන් රාමුව යටතේ අභියාචනා සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සඳහා ඇති නිර්දේශ පරිශීලනය කරන්න)